


# ආඩම්බර රෝස පඳුර



H.M.ලිතුම්සා ලෙෂාදි

# ආඩම්බර රෝස පඳුර

කතා:එච්.එම්.ලිතුම්සා ලෙෂාදි හේරත්
චිත්‍ර:එච්.එම්.ලිතුම්සා ලෙෂාදි හේරත්
ISBN:978-624-208-189-2
දිනය:2025-02-25

# පිදුම

වසරක කාලයක්
මා හට අකුරු කරන්නට
සෙවණ දුන්
ආදරණීය
මහාමයා බාලිකා විදුහල් මැණියන්ට
සෙනෙහසින් පුදන්නෙමි..... !!!

# පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන ඇත්එදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



එකමත් එක කැළෑවක
ගඟක් ළඟ
ලස්සන රෝස පඳුරක් තිබුණා.




වැස්ස නිසා රෝස පඳුරේ
පුංචි පුංචි පොහොට්ටු පිපුණා.
රෝස පඳුර රතු ගවුමක් වගේ.


රෝස පඳුර හරිම
ආඩම්බරෙන් වට පිට බැලුවා.





පිපුණු මල් දැකපු මී මැස්සන්,
සමනලයන් පැණි බොන්න
රංචු රංචු ආවා.






අනේ! ඔයා හරිම ලස්සනයි.සුවඳයි.
අපිට පැණි ගන්න පුළුවන්ද?
පුංචි සමනලයෙක් ඇහුවා.



"මාව අල්ලන්න එපා.මාව කැත වෙයි.
මගේ පැණි ඔයාලට දෙන්න බෑ."
රෝස පඳුර කිවුවා.

නපුරු රෝස පඳුර
සමනල්ලු එළවා දැමුවා.









මේ සිදුවීම බලාසිටි
පුංචි නිදිකුම්බා පඳුරක් මෙහෙම කිවුවා.

"යාලුවේ අපි නපුරු වෙන්න හොඳ නෑ.
සමඟි වෙලා වැඩ කරන්න ඕනේ.
කරුණාව දක්වන්න ඕනේ."



නිදිකුම්බා
පඳුර
රෝස
පඳුරට
මෙහෙම කිවුවා.

"ඔයා එනවද මට කියලා  දෙන්න."

රෝස පඳුර නිදිකුම්බා පඳුරට
මෙහෙම කිවුවා.

"ඔයා කැතම කැතයි.බිම දිග විතරයි
යන්නේ,ඔයා විෂ තියෙන කටු ගහක්,
කවුරු හරි ඇඟේ ගෑවුණාම පරවෙන
කැතම කැත කෙනෙක් ඔයා."

රෝස පඳුර නපුරු විදිහට බැන්නා.






දවසක් කැළෑවට
ලොකු සුළඟක් ආවා.
ගස් වැල් ඇඹරී අතු කොළ
කඩා වැටුණා.



රෝස පඳුරේ අතු මල් සුළඟට
ගසා ගෙන ගියා.
රෝස පඳුර ඉදිරී වැටෙන තරමට
සුළඟ සරවුණා.
"අනේ මාව බේරා ගන්නකෝ"
රෝස පඳුර හයියෙන් ඇහුවා.



නිදිකුම්බා පඳුරට දුක සිතුණා.
රෝස පඳුර ගැලවෙන්නයි යන්නේ.
මං ඉක්මණින් උදවු කරන්න ඕනෑ.
පුංචි අත් වලින් රෝස පඳුර
අල්ලා ගත්තා.
අනෙක් පුංචි ගසුත් එකතු වුණා.
රෝස පඳුර බේරා ගත්තා.



"අනේ,මට සමාවෙන්න
ඔයාලා හැමෝම මට උදවු කළා.
හැමෝටම ගොඩාක් ස්තූතියි."

රෝස පඳුර ආයේ කවදාවත්
ආඩම්බර වුණේ නෑ.
හැමදෙනාම සතුටින් සමඟියෙන්
සිටියා.





පුංචි අපිත්, රෝස පඳුර වගේ
ආඩම්බර නොවී
සමඟියෙන් ඉන්න ඕනේ.



# ස්තූතිය

මාව පුංචි කතුවරියක් කළ මහනුවර
මහාමායා බාලිකා විදුහලේ
විදුහල්පතිතුමියටත්, ප්‍රාථමික
අංශයේ විදුහල්පතිතුමිය හා
පංතිභාර ගුරුතුමිය වන ප්‍රමිතා
වෙත්තසිංහ ගුරු මෑණියන්ටත්,
අනෙකුත් ගුරු මෑණිවරුන්ටත් ගුරු
පියවරුන්ටත්, ආදරණීය අම්මා,
තාත්තා, සීයා, අත්තම්මාටත් මාගේ
හෘදයාංගම ස්තූතිය පුද කරමි

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල්වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්



